#  ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1947/24 - 2015 දෙසැම්බර් මස 30 වැනි බදාදා - 2015.12.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 (1) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, (2015 මාර්තු 31 දින අංක 1908/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ නියමය මගින් අවසන්වරට සංශෝධිත) එකී පනතේ 139 වැනි වගන්තිය ප්‍රකාරව එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදන ලද නියමයක් ලෙස සලකනු ලැබිය යුතු වූ ශ්‍රී ලංකාවේ කැළණිය විශ්වවිද්‍යාලය පිහිටුවන ලබන නියමයේ උපලේඛනයේ I වැනි තීරයේ සහ II වැනි තීරයේ අනුරූප සටහන්වල සඳහන් වන “වානිජ සහ කළමනාකරණ අධ්‍යාපන පීඨය” යන සටහනට ඉක්බිතිවම, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම නියමයේ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

**උපලේඛනය**

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| පරිගණක හා තාක්ෂණ පීඨය | 1. මෘදුකාංග ඉංජිනේරු අධ්‍යයන අංශය<br>2. පරිගණක පද්ධති ඉංජිනේරු අධ්‍යයන අංශය<br>3. ව්‍යවහාරික පරිගණන අධ්‍යයන අංශය”. |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2015 දෙසැම්බර් මස 23 වැනි දින.
කොළඹ දී ය.

01 - 532

1A - PG 2746 — 508 (2015/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*